Learning Resource Center R De Mazenod College Kandana

*පහත සඳහන් වාක්‍ය වල ඉරිගසා ඇති පදයේ අර්ථය නිවැරදිව තෝරා යටින් ඉරක් අඳින්න.*

01) අද පවත්නා ශාසන පුනර්ජීවයේ පුරෝගාමියා වනුයේ වැලිවිට සරණංකර හිමියන්ය.
 a. මුල් වූ තැනැත්තා
 b. නැවත පණ ගැන්වීමේ
 c. පුනරුත්පත්තියේ
 d. ආගම ප්‍රචාරය කළේ

02) අපි යමු දරුවනේ, සේදූරි කරමු.
 a. බත් කමු
 b. ගොයම් පාගමු
 c. ඉක්මන් කරමු
 d. තේ බොමු

03) කරත්ත අඹරාවක හැඩය ගන්නා මේ පැල්පත්වල තමා සතු උපකරණ සියල්ල තබා ගනිති.
 a. රෝදයක
 b. කරත්තයේ ගොනුන්ගේ
 c. කරත්ත දක්කන්නන්ගේ
 d. වහලයක

04) කිතුණු ජනයා ජේසුගේ උපත මහත් බැතියෙන් අනුස්මරණයය කරති.
 a. සිහි කිරීම
 b. නත්තල් දවස
 c. අනුන් සැමරීම
 d. මරණය

පහත සඳහන් පදවලට සමාන පදය වරහන් තුළින් තෝරා ඉරක් අඳින්න.

05) ස්ත්‍රිය ( අක්ෂි, කත, තුරු, ගුවන )
06) කීර්තිය ( යස, තඹරු, කෙසරු, ඔසු )
07) ගින්දර ( කේඩෑරි, මග, අග්නි, අරණ )
08) දූපත ( දීපය, පියන, දියත, දිවාකර
09) පක්ෂියා ( වර්ණ, පුණ්‍ය, නිති, සකුණ )

පහත සඳහන් ඉඟිවැකි වල අර්ථය වරහනින් තෝරා ලියන්න.

10) ඇගේ මාළු නටනවා
11) මුහුණේ දලි ගෑවා
12) අත දෙනවා
13) ඇඟට ලේ ඉනුවා

( කලබලයෙන්, විශාල අනතුරකින් බේරීම, ඉතාසේමන්, උදව් කරනවා, දැඩි ලෙස කේන්ති යාම, නින්දා අපහාස කලා )

පහත සඳහන් ප්‍රස්ථාව පිරුළු වල ඉතිරි කොටස පුරවන්න.

14) ගහෙන් වැටුණු මිනිහට .......................................................................................................

15) කළුවා .......................................................................................................

16) අතුකඩා .......................................................................................................

17) පුහුල් හොරා .......................................................................................................

18) අනුන්ට කළ දේ .......................................................................................................

නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

19) නයමුදල්, ණයමුදල්

20) අසාධාරණ, අසාධාරන

21) ආහාෂය, ආහාසය

22) කොට්ඨාස, කොට්ඨාශ

23) පුස්ථකාල, පුස්තකාල

පහත සඳහන් වාක්‍ය වල ඉරිගසා ඇති පදයේ බහුවචන පදය හිස්තැනෙහි ලියන්න.

24) සීනුව නාද වූ විට නිමල් මිතුරාගේ <u>පොත</u> ඔහුට දී තම .......................... බෑසය තුළට දමා ගත්තේය.

25) ආහාර අනුභව කිරීමේ <u>චාරිත්‍රයට</u> පසු අනෙක් .......................... සඳහා අපි සූදානම් වූයෙමු.

පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද තෝරා යටින් ඉරක් අඳින්න.

26) උත්තම ( උතුම්, මහත්මා, අධම )

27) සොම්නම ( දොම්නස, සතුට, ප්‍රීතිය )

28) ප්‍රබල ( ප්‍රශංසනීය, දුර්ගුණ, අතිරික්තය )

29) ආකර්ෂණ ( අනාදරය, විකර්ෂණ, අතිරික්තය )

30) ළපටි ( මේරූ, ළදරු, ළාදළු )

පහත සඳහන් උක්ත පද වලට අයත් අනුක්ත පදය ඉදිරියෙන් ලියන්න.

31) මම

32) ඔව්හු

33) මිනිස්සු

34) හෙදියන්

35) ගොවියෙක්

අක්ෂර මාලාව සම්බන්ධ පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

36) මිශ්‍ර සිංහල අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන කීයද ?

37) අක්ෂර මාලාවේ අල්පප්‍රාණ අක්ෂර කීයක් තිබේද ?

38) අක්ෂර මාලාවේ මහාප්‍රාණ අක්ෂර ගණන කීයද ?

39) අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර ගණන කීයද ?

40) සිංහල අක්ෂර මාලාව කොටස් කීයකට බෙදේද ?

II කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

❖ පහත සඳහන් අක්ෂර හඳුන්වන නම ඉදිරියෙන් ලියන්න.

1- ශ

2- ඨ

3- ස

4- ණ

5- ක

❖ පහත සඳහන් පද යොදා නිවැරදිව වාක්‍ය 5ක් සාදන්න.

1- මිනිසුන්

2- මම

3- සොරකු

4- කිරිල්ලියක

5- ඔව්හු

❖ පහත සඳහන් වාක්‍ය වල හිස්තැන් වලට සුදුසු උක්ත පද හෝ අඛ්‍යාත පද යොදන්න.

1 .................................................... පාසල අවසන් වී ඉක්මනින් ගියෙමි.

2 .................................................... ක්‍රීඩා කළෙහිද ?

3 .................................................... පන්සල් ගොස් බුදුන් වැන්දාය.

4 නුඹලා ඊයේ පුස්තකාලයට ..........................................

5 ඔහු ගසයට තිබූ බංකුවේ ..............................................

6 වෛද්‍යවරියක් ලෙඩුන්ට බෙහෙත් ........................................................

7 ................................................................ ඇඳුම් මැසුවෝය.

8 ඔව්හු වන්දනාව සඳහා පිටත්ව ................................................

❖ පහත සඳහන් ප්‍රකාශ කා විසින් කා හට පවසන ලද්දේද ?

1 " එහෙත් ඔබටත් වරදින්නට බැරි නැත ඇ පෙනුමට නම් මහ යක්ෂ අසරුවෙක් "

........................................................ විසින් ............................................හට

2 " මොකටද අයිසේ කුඹුරට යතුරක් "

........................................................ විසින් ............................................හට

❖ පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු රචනයක් ලියන්න.

- පාසල් මව් වදිනෙමු සැමදා
- මගේ මව්බිම සදා වාසනාවන්
- ගංගාවක් කතා කරයි
- මව්පියන් උතුම්කොට සලකමු
- අපේ කමතේ ගොයම් පාගන දවස අදයි